// ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,107 — 1960 අප්‍රේල් 14 වැනි බ්‍රහස්පතින්ද — 14.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදි)

# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 277 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 281 | රට නිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 285 | විවිධ දැන්වීම ... ... ... | — |


## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායඹී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක්ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්‍ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම් කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්‍ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්‍ෂා කාලය අවසන් වීමෙත් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්‍ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එන තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සෑහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්‍ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිද්ධ වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුඡෙඡදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. **අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සැහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන් හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන් හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්. ඉනා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉනා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡෙදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපෙක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපෙක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට සමකුව වූවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපෙක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැලපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය මාර්ග හා කර්මාන්ත අංශයට විශේෂ ආධුනිකයන් බඳවා ගැනීම

ලංකාආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා කර්මාන්ත අංශයේ ගොඩනැගිලි, දුම්රිය මාර්ග, පාලම්, සංඥා හා ගල් කැඩීම පිළිබඳ ශාඛාවල II වැනි ශ්‍රේණියේ ෆෝර්මන් තනතුරේ ඇබෑර්තුවලට පත්වීම් දීමට පුහුණුවක් ලබාදෙනු පිණිස විශේෂ ආධුනික තනතුරු සඳහා පිරිමි අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

2. **සුදුසුකම්.**—

(i) අපේක්ෂකයෝ ලාංකිකයෝ විය යුත්තාහ.

(ii) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයෙහි අපේක්ෂකයෝ වයසින් අවුරුදු 16ට නො අඩු වූත් අවුරුදු 21ට නොවැඩි වූත් මනා ශරීර සෞඛ්‍යයෙන් යුතු වූත් අය විය යුත්තාහ.

(iii) ඉල්ලුම්කරුවෝ ගණිතයද විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ සහතික විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් හෝ විභාගයකින් සාමාර්ථය ලත් අය විය යුත්තාහ.

(iv) අයදුම්කරුවෝ අවිවාහක අය විය යුත්තාහ.

**සංලක්ෂ්‍යය.**—වයස අවුරුදු 21ට වැඩි වූවත් ඉල්ලුම් පත්‍ර බාර ගන්නා අවසාන දිනයෙහි අවුරුදු 30ට නොවැඩි ඉහත සඳහන් සුදුසු කම් ඇති දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයන්ගේ ඉල්ලුම් පත්‍ර බාරගනු ලැබේ.

3. (i) මෙම ගැසට් පත්‍රයෙහි මුල දැක්වෙන සාමාන්‍ය කොන්දේසි අනුව වයස පිළිබඳ අනුග්‍රහයට හිමිකම් කියන සේවා මුක්ත භටයින්, යුධ හමුදාවේ සේවය සතුටුදායක බව තහවුරු කිරීමට සේවා කාලයද අතිරේක වශයෙන් පැහැදිලිව සඳහන් කරන ලද සේවයෙන් අස්වීමේ සහතික ඉදිරිපත් කළ යුතුය.

(ii) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති පසුගිය යුද්ධ සමයෙහි සිර කරුවන්ව, එසේ සිර අඩස්සියේ සිටි වග පිළිගැන්වෙන සාක්ෂි ඉදිරිපත් කළ හැකි වූවොත්, නියමිත වයස සීමාව ගණන් ගැනීමේදී ඒ සිරබාරයෙහි ගතකළ කාලය වයසින් අඩුකරන්නට අවසර ලැබේ.

(iii) අද්මිරාල්තියත්, ගුවන් අමාත්‍යාංශයත් යටතේ ලංකාවෙහි පිහිටි එක්සත් රාජ්‍යය සතු විවිධ ආයතන වලින් ඉවත් කරන ලද හේවා වසමට අයත් නොවූනු සේවකයන්ට—

(අ) අවශ්‍ය අන් සියළුම සුදුසුකම් ද,

(ආ) සතුටුදායක අඛණ්ඩ එබඳු සේවයක්ද ඇතහොත් නියමිත වයස සීමාව ගණන් ගැනීමේදී එක්සත් රාජ්‍යය සතු සේවාවන් හී යෙදුනු කාලය වයසින් අඩුකරන්නට අවසර ලැබේ.

**සංලක්ෂ්‍යය.**—මේ ඡෙදයෙහි ගණවල අයදුම්කරුවන් පිළිබඳව විවාහය අයෝග්‍යතාවයක් නොවන්නේ ය.

4. ඉල්ලුම් පත් වලට මෙසින් (මුල් පිටපත් නොවූ) පිටපතක්ද අමුණා එවිය යුතුය :—

(අ) ඉල්ලුම් පත් බාරගන්නා අවසාන දිනයෙහි වයස අවුරුදු 16ට නොඅඩුද, අවුරුදු 21ට නොවැඩිද වග දැන්වෙන ඉල්ලුම් කරුගේ උප්පැන්න සහතිකය (පාඨශාලාවල භාවිතය සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික පත්‍ර හෝ බව්තිස්ම සහතික පත්‍ර හෝ දිවුරුම් සහතික පත්‍ර හෝ උප්පැන්න සහතික පත්‍ර වෙනුවට භාර නොගනු ලැබේ).

(ආ) උසස් අධ්‍යාපන සුදුසු කම් පිළිබඳ සහතික.

5. වග කිව යුතු අයෙකුගෙන් ලබා ගත් යහපත් චරිතය පිළිබඳ සහතිකයක් ඉල්ලුම් පතට ඇමිණිය යුතුය. අපේක්ෂකයා ආණ්ඩුවේ හෝ උපකෘත හෝ පාසැලක අධ්‍යාපනය ලැබූවෙකු නම්, චරිත සහතිකය ලබාගත යුත්තේ අධ්‍යාපනය අවසන් කළ පාසැලේ ප්‍රධානාචාර්යතුමාගෙන් ය. එසේ නැත්නම් එම සහතිකය සාමාදාන විනිශ්චයකරුවෙක්, අද්වකාත් කෙනෙක්, පෙරකදෝරු කෙනෙක් හෝ නොතාරිස් කෙනෙක් හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරියෙක් හෝ රු. 2,400 හෝ ඉන් වැඩි වාර්ෂික වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර නිලධාරියෙක් හෝ සාමාන්‍යයෙන් කෙලින්ම තොරතුරු ලබාගත හැකි ප්‍රකට තැනැත්තෙක් හෝ යන කවරෙකුගෙන් වුවද ලබාගත හැකිය. සහතිකය දෙන අයගේ නම, පදවි නාමය හා ලිපිනයද සහතිකයෙහි පැහැදිලිව සඳහන් විය යුතුය (ආණ්ඩුවේ ස්ථිර තනතුරක් දරණ අපේක්ෂකයන් විසින් මෙම උප වගන්තිය අනුව සහතිකයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය නැත).

6. ඉල්ලුම් පත්‍ර පහත දැක්වෙන ආකෘතිය අනුව ඉල්ලුම්කරුගේ අත්අකුරින්ම ලියා සියලුම සහතික පිටපත් ද සමග එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයෙහිදී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. මුද්‍රිත ඉල්ලුම් පත්‍ර නොමැත. ඉල්ලුම් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට නොඑවා ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන 60. 4. 29 දින ප.ව. 4.30ට හෝ එයට කලින් හෝ කොළඹ ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරි තැනට ලැබෙන පරිදි ඉදිරිපත් කළ යුතුය.

7. නියමිත දිනය ඉක්මවා මෙම කාර්යාලයට ආණ්ඩුවේ නිළධාරීන් ගෙන් ලැබෙන ඉල්ලුම් පත්‍ර පිළිගනු ලැබෙන්නේ ඒ ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත නියමිත දිනට කලින් ලැබුණු බවටත්, ප්‍රමාදයට පිළිගත හැකි හේතු දක්වා ඒ ඉල්ලුම් පත්‍ර බාර ගන්නා ලෙසටත් දෙපාර්ත්මේන්තුවේ ප්‍රධානියා නිර්දේශ කරනු ලැබූ විට පමණය.

8. තෝරාගනු ලබන අපේක්ෂකයින් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යය ඇති වග නිගමනය කිරීම පිණිස පැවැත්වෙන දෘෂ්ටි පරීක්ෂණයක්ද ඇතුලත්, වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

9. **සේවා කොන්දේසි.**—

(i) තෝරාගන්නා ලද අපෙක්ෂකයෝ සිව් වසක පුහුණුවක් ලැබිය යුත්තාහ. ඔවුන් බැඳී ඇති විශෙෂ අංශය වෙනුවෙන් ලැබෙන ප්‍රායෝගික පුහුණුව මෙසේ ය :

**ගොඩනැගිලි අංශය**

මාස 6. රත්මලානේ වැඩපල.

අවුරුදු 1. සැලැස්ම කාර්යාලය හා (මූලික) භූමි මානක ශාස්ත්‍රය.

අවුරුදු $2\frac{1}{2}$. කායශීලය හා වේලාව සටහන් කිරීම. ඒ පිළිබඳ පළමු වැනි අවුරුද්දේ කෘත හස්තතාවය ලැබිය යුත්තේ කොළඹ දිස්ත්‍රික්කයකදීය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය මාර්ග හා කම්මාන්ත අංශයේ විශෙෂ ආධුනික තනතුරක් ඉල්ලීම

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :———.

 පෙළපත් නාමය (අගට යෙදෙන නම) :———.

 අනිත් නම් :———.

2. ලිපිනය (පැහැදිලි අකුරින්) :———.

3. රටවැසිකම් :—

 (අ) පරම්පරානුගත ලාංකිකයෙක් ද, නැතහොත්—

 (ආ) ලියා පදිංචි කරවා ගැනීමෙන් රටවැසි කම ලත් ලාංකිකයෙක් ද, පරම්පරානුගත ලාංකිකයෙක් නම්, මේ තොරතුරු සඳහන් කළ යුතුය :—

 උපන් ස්ථානය :—

 (අ) අයදුම්කරු :———.

 (ආ) අයදුම්කරුගේ පියා :———.

 (ඇ) අයදුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තා :———.

 (ඈ) අයදුම්කරුගේ පිය පාර්ශවයේ මී මුත්තා :———.

 ඉල්ලුම්කරු උපන්නේ ලංකාවෙහි නම්, (අ) ඇතුළුව (ආ) හෝ (ඇ) සමග (ඈ) හෝ සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නොවේ නම්, (අ) ඇතුළුව (ආ) හා (ඇ) හෝ (ඇ) හා (ඈ) හෝ සම්පූර්ණ කළ යුතුයි.

4. (අ) උපන් දිනය (සහතිකයේ පිටපත ඇමිණිය යුතුය) :———.

 (ආ) 1960.4.29 වැනි දිනට වයස :

 අවුරුදු——, මාස——, දවස්——.

5. සමත්වූ විභාග (සහතික පිටපත් ඇමිණිය යුතුයි) :———.

6. විවාහකද අවිවාහකද යන වග :———.

7. දුම්රිය සේවකයෙක් ද, නැතහොත් දුම්රිය සේවකයෙකුගේ පුතෙක් ද යන වග (විස්තර කෙටියෙන් සඳහන් කරන්න) :———.

 දුම්රිය සේවකයෙක් නම්, මුල් පත්වීම ලත් දිනයත්, දැනට උසුලන පදවියත් :———.

8. දැනට රක්ෂාවක් තිබේ නම් එය :———.

9. සේවා මුක්ත භටයෙක් ද, යුධ සිරකරුවෙක් ද, එක්සත් රාජ්‍යයේ අද්මිරාල්තිය හා ගුවන් අමාත්‍යාංශය සතු ලංකාවේ ආයතනයක (හේවායෙකුගේ නොවන) සේවයෙන් මුදවනු ලැබුවෙක් ද යන වග (විස්තර දක්වා ඔප්පු කැරෙන සාධකද මෙය සමග ඉදිරිපත් කළ යුතුයි) :———.

10. කිසියම් වරදකට වරදකරුවෙකු හෝ චෝදනා කරනු ලැබුවෙකු හෝ සිතාසි ලැබුවෙකු නම් එය සඳහන් කර දිනයත්, වරද කුමක් ද යන වගත්, උසාවියේ නමත්, නඩු නොම්මරයත් දන්වන්න :———.

මා දැක්වූ තොරතුරු මා දන්නා පමණටත් මගේ විස්වාසයට අනුවත් සත්‍ය බවට සහතික කරමි. මෙම තනතුරුවලට බඳවා ගැනීමට අදල නියමයන් අනුව, මා සුදුස්සෙකු නොවන බව පෙනී ගියහොත් මගේ ඉල්ලුම් පත්‍රය අවලංගු වෙන බවද දනිමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

---

## විදුලි සංදේශ පරීක්ෂකවරුන් වශයෙන් පුහුණු කිරීම පිණිස අයදුම්කරුවන් බඳවා ගැනීම

තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු ශාඛාවේ විදුලි සංදේශ පරීක්ෂකයින් වශයෙන් පුහුණු කිරීම පිණිස ආධුනිකයන් තෝරා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය තම අත් අකුරින්ම අයදුම්පත් ලියා 1960. 5. 14 වෙනි දිනට ප්‍රථම ලැබෙන සේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු තැන, මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලය ගොඩනැගිල්ල, තැපැල් පෙට්ටිය අංක 503, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි.

2. අයදුම්කරුවෝ මූලික ගණිතය, භෞතික විද්‍යාව, යාන්ත්‍රික විද්‍යාව සහ/හෝ රසායන විද්‍යාව යන විෂයයන් සහිතව පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට, සමාන හෝ උසස් හෝ විභාගයකින් සාමර්ථ්‍යය ලබා සිටිය යුත්තාහ.

3. සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු තහවුරු කිරීම සඳහා සැලකිය යුතු සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(i) 1960. 5. 14 වෙනි දිනට වයසින් අවුරුදු 17 නොඅඩු අවුරුදු 22 ට නොවැඩි බවට—කෙසේ වෙතත් 1960. 5. 14 වෙනි දිනට වයස අවුරුදු 28 නොවැඩි තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවය කරන අයදුම්කරුවන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැක. එහෙත් ඔවුන් වයසින් අවුරුදු 22 ට පෙර මුලින්ම දෙපාර්තමේන්තුවට බැඳුනාවූත් අනිකුත් කරුණු අනුව සුදුසුකම් සහ 6වන ඡේදයේ සඳහන් සුදුසුකම් වලින් කවර හෝ සුදුසුකම් දෙකක් හෝ පැරණි ක්‍රමය යටතේ (අවසානයෙන් දක්වා ඇති සටහන බලන්න). ඊට සමාන සුදුසුකම් හෝ ඇත්තාවූ අය විය යුත්තාහ.

(ii) යහපත් චරිතයෙන් යුක්ත බවට—

 සැලකිය යුතුයි :—ඉහත (i) උප ඡේදයේ අනුග්‍රහයන් යටතේ පුහුණුව සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තෝරා ගතහොත් පුහුණුවීමට යාමට පෙර දැනට සිටින තනතුරෙන් ඉල්ලා අස්විය යුතුය. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කරුණු වලදීද ඔවුන් සලකනු ලබන්නේ නව ප්‍රවේශකයන් වශයෙනි.

4. තෝරා ගන්නා අයදුම්කරු යහපත් ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු අතර ඔහුගේ ඇස් පෙනීම ද හොඳින් තිබිය යුතුය. ලංකාවේ ඕනෑම පළාතක සේවය කිරීමට ශරීර සෞඛ්‍ය අතින් ඇති තම යෝග්‍යත්වය ගැන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටින ලෙස ඔහුට නියම කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණ ගාස්තුව අයදුම්කරු විසින් ගෙවිය යුතුය.

5. තෝරා ගන්නා අයදුම්කරුට ලංකා කාර්මික විද්‍යාලයේ දෙවර්ෂයක පුහුණුවක් සහ දෙපාර්තමේන්තුවේ නොයෙකුත් ඉංජිනේරු අංශවල අවුරුද්දක ප්‍රායෝගික පුහුණුවක් ද දෙනු ලැබේ.

6. පහත නියම කර ඇති කාල සීමවාන් තුල අයදුම්කරුවෝ ලන්ඩන්හි සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ පහත සඳහන් සහතික ලබාගත යුත්තාහ.

| | |
|---|---|
| (අ) මුල් වර්ෂයේ පුහුණුව සම්පූර්ණකර වර්ෂයක් ඇතුලත | මූලික ගණිතය—බී<br>විදුලි සංදේශ මූලධර්ම—ඒ<br>මූලික විදුලි සංදේශ අභ්‍යාසය |
| (ආ) දෙවන වර්ෂයේ පුහුණුව සම්පූර්ණකර වර්ෂයක් ඇතුලත | විදුලි සංදේශ මූලධර්ම—බී සහ පහත සඳහන් කරුණු වලින් 2 ක්.<br>ටැලිෆෝන් සහ විදුලි පණිවුඩ ක්‍රම—ඒ<br>විදුලි පණිවුඩ ක්‍රම—බී<br>ගුවන් විදුලි සහ මාර්ග පණිවුඩ යැවීම—ඒ<br>මාර්ග ලීමේ පුහුණුව—ඒ |

7. පුහුණුව ආරම්භයේ සිට III, පංක්තියේ පරීක්ෂකයන් වශයෙන් පත්කරන තුරු පුහුණුවන පරීක්ෂකයින් ලෙස අයදුම්කරුවන් වර්ගකර ඔවුන්ගේ ප්‍රගතිය සහ හැසිරීම සතුටුදායක නම් පහත සඳහන් පරිමාණයන් අනුව වැටුප් ගෙවනු ලැබේ.

 පළමුවන වර්ෂය දිනකට රු. 2.20 බැගින්

 දෙවන වර්ෂය දිනකට රු. 2.60 බැගින්

 තුන්වන වර්ෂය දිනකට රු. 3.00 බැගින්

පුහුණුව සම්පූර්ණ කර සුදුසුවීමෙන් පසු පරීක්ෂකයින්ගේ පුරප්පාඩුවලට පත්වීම් ලැබෙනතුරු සිටින කාලය තුළ සිව්වන වර්ෂයේදී දිනකට රු. 3.40 බැගින් ද, පස්වන වර්ෂයේදී සහ ඊට පසුව දිනකට රුපියල් 3.80 බැගින් ඔවුන්ට ගෙවනු ලැබේ. නිවාඩු දිනවලට සහ ඔවුන් නොපැමිණෙන දිනවලට වැටුප් ලැබීමට ඔවුන්ට හිමිකමක් නැත.

8. ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන සෑසි පරීක්ෂණයෙන් අසමර්ථවන අයදුම්කරුවන්ට තවත් එක් වරක් එනම් පළමුවන වර්ෂයේ හෝ දෙවන වර්ෂයේ හෝ විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. එවැනි අයට නැවත විභාගයට පෙනී සිටින වර්ෂය තුළ නොගෙවනු ඇත. එවැනි අයට නැවත සිටීමට නොකැමති නම් ඔහුට දෙපාර්තමේන්තුව හැරයා හැක. එහෙත් පහත දැක්වෙන 12 වන ඡේදය සඳහන් ගිවිසුම සහ පොරොන්දු පත්‍රය අනුව ඔවුන් දඩවලට භාජනය වනු ඇත.

තමන්ගේ පාඨමාලාවේ වැඩ වලින් අසමර්ථ වන අයට නැවත වරක් පාඨමාලාවේ වැඩ කරගෙන යෑමට ඉඩ දෙන්නේ ද යන වග රඳා පවත්නේ, ඔහුට එවැනි පාඨමාලා වැඩට ඉඩකඩ සැලසිය හැකිද යන්න ගැන ලංකා කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ කරන තීරණය උඩය. ඉඩකඩ සැලසීමට අධ්‍යක්ෂකට නොහැකි නම් ඔහුට එය හැර යාමට සහ ගිවිසුම සහ පොරොන්දු පත්‍රය යටතේ දඩ ගෙවීමට ද සිදු වන්නේ ය.

9. නියමිත කාල සීමාව තුළදී අවශ්‍ය සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් සහතික ලබා ගැනීමට අපොහොසත් වූවන්ට පෝස්ට්මාස්ටර් ජනරාල්ගේ අභිමතය පරිදි රු. 3.00 දෛනික වැටුපක් පිට අවුරුදු 3 කට නොවැඩි කාලයක් පුහුණුවන පරීක්ෂකවරුන් වශයෙන් තවදුරටත්

කටයුතු කරගෙන යෑමට අවසර දීමට ඉඩ තිබේ. ඔහු තීරණය කරන අන්දමේ වැඩ ඔවුනට පවරනු ඇත. අවශ්‍ය සහතික ලබා ගැනීමෙන් පසු ඔවුන් III වන පංතියේ පරීක්ෂකවරුන් වශයෙන් පත් කිරීම සඳහා සලකා බැලීමට පෙර රු. 3 දෛනික වැටුපක් ඍට අවුරුද්දක කාල සීමාවක් තවදුරටත් කටයුතු කළ යුතුය. ඉහත සඳහන් අනුග්‍රහය නොදෙනු ලබන අයට එය අත්හැර යෑමට සහ ගිවිසුම සහ පොරොත්දු පත්‍රය අනුව දඩ මුදල් ගෙවීමට නියම කරනු ලැබේ.

10. ලංකා කාර්මික විද්‍යාලයේ පුහුණුවන කාලය තුළ රාජකාරි කාල වේලාවන් ලංකා කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ඇත. ප්‍රායෝගික පුහුණුව ලබන කාලසීමාව තුළ ඉංජිනේරු ශාඛාවේ බලපවත්වන රාජකාරි කාලය තුළ වැඩ කළ යුතු අතර විනය, ආදිය පිළිබඳව දෙපාර්තමේන්තුවේ සෑම රෙගුලාසියක්ම පිළිපැදිය යුතුවේ. නිවාඩු දීම සහ අනෙකුත් සේවා කොන්දේසි ආණ්ඩුව මගින් කලින් කල නියම කරන පරිදිය.

11. පුහුණුවන පරීක්ෂකයකුගේ ප්‍රගතිය සහ හැසිරීම අසතුටුදායක යයි කවර අවස්ථාවක හෝ පෙනී ගියහොත් පෝස්ට්මාස්ටර් ජනරාල්ගේ නියෝගය උඩ ඔහු අස්කරනු ලැබේ. ඒ පිළිබඳ ඔහුගේ තීරණය අවසාන තීරණය වේ.

12. පුහුණුව සඳහා තෝරා ගන්නා අයදුම්කරුවෝ රුපියල් 50 ක මූලික ඇපයක් තබා ගිවිසුම යථා පරිදි ඉටු කිරීමටත් ක්‍රියාවේ යෙදීමටත් ඇප කරුවන් දෙදෙනෙකු ඇතිව රුපියල් 5,000 ක පොරොත්දු ඔප්පුවකට ඇතුළත් විය යුතුය. ඔවුන් පුහුණුව ලබන දෙවන මාසයෙන් පටන්ගෙන තම තමන්ගේ පඩි ප්‍රමාණය අනුව රුපියල් 2 සිට 6 දක්වා මුදලක් අප අර මුදලට දායක මුදල් වශයෙන් මාස්පතා ගෙවිය යුතුය (පරීක්ෂකයන්ගෙන් ලබාගන්නා වැඩිම ඇප මුදල රුපියල් 1,000 කි).

13. පුහුණුවන පරීක්ෂකයකු ඉහත සඳහන් III වන වගන්තිය යටතේ අස්කළ විට ඔහු විසින් තබන ලද ඇප මුදලට ඔහු අහිමි වේ. පුහුණුවන කාලය තුළ හෝ පුහුණුව සම්පූර්ණකර වර්ෂ පහක් ඇතුළත අස්වුවහොත් ඔහු අස්වන දිනය දක්වා ඔහුගේ පුහුණුව වෙනුවෙන් තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව මගින් ගෙවූ හෝ ඉසිලූ සියලුම වියදම් ද සහ ඔහුගේ නොසැලකිල්ල නිසා හෝ අලාභහානි සිදුවූ හෝ භාණ්ඩවල වටිනාකම ද ආපසු ගෙවිය යුතුය.

14. සෑම කරුණකින්ම සුදුසු යයි ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු තැන ඒත්තු ගන්නාවුත් ඉහත සඳහන් සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් සහතික ලැබුවාවූත් "පුහුණුවන පරීක්ෂකයින්" පුරප්පාඩු ඇතිවන පරිද්දෙන් සුදුසුකම්ලත් දෙපාර්තමේන්තුවේ I වෙනි ශ්‍රේණියේ සුළු පරිපාලකවරුන් සමග III වන පන්තියේ විදුලි සන්දේශ පරීක්ෂකයින්ගේ ශ්‍රේණියට යෝග්‍යතා පිළිවෙල අනුව පත්කිරීමට සුදුස්සන් වනු ඇත. පත්වීම අවුරුදු තුනක පරීක්ෂණ කාලයකින් යුක්තය. III වන පන්තියේ පරීක්ෂකයින්ගේ වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 1,860—120—2,580 වේ. II වන පන්තියට උසස් කිරීමට පළමු නියමිත සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් සහතික ලබාගත යුතුය. ඔවුන්ගේ ඊට අනතුරු උසස් කිරීම එකල පවත්නා වැටුප් ක්‍රම අනුව දෙපාර්තමේන්තුව රෙගුලාසිවලට යටත්ව කෙරේ.

15. වැඩෙහි සවභාවය අනුව සහය ඇතිව හෝ නැතිව දිවයිනේ කවර ස්ථානයක හෝ සියලුම වර්ගවල ටැලිෆෝන්, විදුලි පණිවුඩ, ගුවන් විදුලි, දුම්රිය විදුලි සුරක්ෂිත උපකරණ, මාර්ග සහ කේබල් නඩත්තු කිරීම සහ සවිකිරීම තැපැල් කාර්යාල ඉංජිනේරු ශාඛාවේ පරීක්ෂකයින්ට අයත් රාජකාරිවලට ඇතුළත්ය. ඔවුන් කළයුතු කාර්යයට එක් අයෙකු සෑහෙන ප්‍රමාණයක එකක් නම්, තම තමන්ගේ ආවුද සහ උපකරණ තම තමන් විසින්ම ගෙනයා යුතුවත් හැර ඔවුන් පත් කරන කාලයෙහි වලංගුව පැවැත්තාවූත් පසුව පනවනු ලබන්නාවූත් දෙපාර්තමේන්තුවේ සියළුම නීති පිළිපැදිය යුතු වේ.

16. ගැසට් පත්‍රයේ පළවෙනි කොටසේ II වෙනි ඡේදයේ ආරම්භයෙහි පළකොට ඇති රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම් පිළිබඳ පොදු කොන්දේසි බලනු මැනවි.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරාල්,

1960. 4. 6 දින දීය,
ප්‍රධාන තැපැල් කාර්යාලය, කොළඹ.

## විදුලි සන්දේශ පරීක්ෂකවරුන් වශයෙන් පුහුණුවීම පිණිස තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවට ඇතුළත්වීම සඳහා ඉල්ලුම් පත්‍රය

අංක ————සහ ————වෙනි දින දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකොට ඇති කොන්දේසි යටතේ————වන මම විදුලි සන්දේශ පරීක්ෂකයකු ලෙස පුහුණුවීම සඳහා තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවට ඇතුළත්වීමට මෙයින් ඉල්ලා සිටිමි.

මගේ උප්පැන්න සහතික පත්‍රයේ ද————විද්‍යාලයේ විද්‍යාලයාධිපතිගෙන් ලබාගත් චරිත සහතිකයක් ද, සහ මා සමර්ථව ඇති විභාගය සහතික පත්‍රවලද සැබෑ පිටපත් මේ සමඟ එවමි.*

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ඔබ ලාංකිකයෙක් ද යන වග :————.
3. උපන් දිනය සහ ස්ථානය :————.
4. තැපැල් ලිපිනය :————.
5. දෙමව්පියන්ගේ නම් : පියා :————.
   මව :————.
6. පියාගේ රක්ෂාව :————.
7. (අ) පියාගේ උපන් දිනය සහ ස්ථානය :————.
   (ආ) පිය පාර්ශ්වයේ මුත්තාගේ උපන් දිනය සහ ස්ථානය : ————.
   (ඇ) පිය පාර්ශවයේ මී මුත්තාගේ උපන් දිනය සහ ස්ථානය : ————.
8. සමත්වූ උසස්ම විභාගය හෝ පෙනී සිටි උපාධි :————.
9. පහත සඳහන් විෂයයන් කිසිවකින් හෝ සියල්ලෙන්ම හෝ ඔබ සමත්වී සිටින්නෙහිද ?
   එසේනම් කවර විභාගයකදී කවර ප්‍රතිඵල සහිතවද ?————.
   මූලික ගණිතය :————.
   භෞතික විද්‍යාව :————.
   ප්‍රායෝගික මූලික ගණිතය :————.
   රසායන විද්‍යාව :————.
10. පහත සඳහන් විෂයයන්ගෙන් ඔබ සමත්වී සිටින්නෙහි ද ? එසේනම් කුමන විභාගයකදී කුමන ප්‍රතිඵල සහිතවද ?
   ඉංග්‍රීසි :————.
   ජ්‍යාමිතිය සහ මූලික ගණිත ඇඳීම :————.
11. ඔබ පාඨශාලා වෙන් අස්වූවාට පසුව රක්ෂාවක නියුක්තව සිටියේ ද ? එසේනම් කුමක් ද ? කොපමණ කල් ද? ————.

* අයදුම් පත්‍රයට ඇමිණිය යුත්තේ සහතික පත්‍රවල පිටපත් පමණකි. මේ පිටපත් ආපසු එවනු නොලැබේ. තෝරාගත් විට අයදුම්කරුවන් විසින් සහතික පත්වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුවේ.

සැලකිය යුතුයි.—ඉහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙළ නොකරන ලද ඉල්ලුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), දොරණ තෙල් සැපයීම සඳහා 1960 මැයි මස 31 වැනි අඟහරුවාද පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1960 මැයි 30 වැනි සඳුද දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 අප්‍රේල් 14 වැනි දින,
කොළඹදීය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කන්තලේ උක්වගාවට වල් පැලෑටි නාශක රසායන ද්‍රව්‍ය රාත්තල් 200ක් සැපයීමේ ටෙන්ඩරය

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 මැයි මස 9 වැනි දින පස්වරු 2.30 වන තුරු ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පෝරම කන්තලේ උක්වගාවේ සාමාන්‍යාධිකාරි තැන වෙත රුපියල් 10ක ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පමණක් ලබාගත හැක. සියලු විස්තර සඳහා මේ ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි ටෙන්ඩර් දැන්වීම බලන්න.

ඒ. වී. රිචඩ්ස්,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 අප්‍රේල් මස 1 වැනිදා
පේරාදෙනියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### බතලගොඩ ගොවිපොළේ පොල් විකිණීම

කුරුණෑගල, මල්ලවපිටියේ කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන විසින් බතලගොඩ ගොවිපලෙහි ඇති පොල් 15,000ක් පමණ විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1960 මැයි මස 6 වෙනි දින පස්වරු 2.30 වන තුරු භාරගනු ලැබේ.

2. කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර්පත්‍ර ඒවායේ එවිය යුතුයි. සියලුම ටෙන්ඩර්පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය, මල්ලවපිටිය, කුරුණෑගල" යන්න එහි පිට ලියා එහි මුදුනේ වම් කොනෙහි "බතලගොඩ ගොවිපලේ පොල් සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතුයි. සියලුම ටෙන්ඩර්පත්‍ර අනු පිටපතක්ද සහිතව සීල් තබන ලද කවරය තුළ බහා ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර එවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර්පත්‍ර බහාලන ලද කවරයේ "බතලගොඩ ගොවිපලෙහි පොල් සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර්පත්‍ර ලැබුණ බව ඒවා විවෘත කරන දිනයේදීම සියලුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4ක් ඇතුලත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු කුරුණෑගල දිස්ත්‍රික්කය භාර කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරිතැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ පොල් සඳහා ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් දින දහයක් ඇතුළත මුළු පොල් තොගයටම සම්පූර්ණ මුදල් ගෙවා ඒවා ඉවත්කර ගත යුතුයි. එසේ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ඉඩ තිබේ.

6. නියමිත පෝරමයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර්පත්‍රයක් ටෙන්ඩර්පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළ හොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත තබාගනී.

9. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි.

10. 1934රේ 19 වෙනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ලද ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

12. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරනු ලබන මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කටවත් වෙනස් නොවන සේථිර ඒවා විය යුතුයි.

15. පිළිගත් ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව දක්වන ලිපිය ලැබී දින 10ක් ඇතුළත පොල්වලට ගෙවා ඉවත්කර ගත යුතුයි.

16. පිළිගත් ටෙන්ඩර්කරු පොල් සියල්ලටම සම්පූර්ණ මුදල ගෙවා ඉවත් කර ගත යුතුයි. පොල් තෝරා ඉන් සමහරක් ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ දෙනු නොලැබේ.

17. මේ පිළිබඳ වැඩි විස්තර බතලගොඩ ගොවිපළ භාර කළමනාකාර තැනගෙන් දැනගත හැක.

ඒ. වී. රිචඩ්ස්,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 අප්‍රේල් මස 4 වෙනි දින,
පේරාදෙණියේ දීය.

---

## පොලොන්නරුවේ ගොවිපලේ දුම්කොළ උදුන් "බාන්ස්" දෙකක් සෑදීම

1960 මාර්තු මස 4 වෙනි දින අංක 12,073 දරණ ගැසට් පත්‍රයේ සඳහන් දැන්වීම සම්බන්ධවයි.

ඉහත සඳහන් ගොවිපලේ දුම්කොළ උදුන් "බාන්ස්" සෑදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1960 අප්‍රේල් මස 22 වැනි දා තෙක් දීර්ඝ කළ බව මෙයින් දැනුම් දෙමි.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
ගොවිකම් අධ්‍යක්ෂ.

1960 මාර්තු මස 31 දින,
පේරාදෙණියේ දීය.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### අනුරාධපුර දිස්ත්‍රික්කයේ හුරුළුවැව ව්‍යාපාරයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් රජයේ ලී මෝලේ පිටපලු අලෙවිකිරීම

දඹුල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් ඉහත සඳහන් ලී මෝලේ දව පිටපලු ඝන යාර 1,500 ක් පමණ අලෙවිකිරීම සඳහා 1960 අප්‍රේල් මස 29 වෙනි දින පස්වරු 3 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. මෙකී පිටපලු හුරුළුවැවේ ලී මෝලේදී වැඩ කරන වේලාව ඇතුලත දී බැලිය හැක.

2. සම්පූර්ණ තොගය සඳහා හෝ කොටස් වශයෙන් සඳහා හෝ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර අනුපිටපතකුත් සමග ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර භාරගෙන දෙසතියක් ඇතුලතදී සම්පූර්ණ මුදල් ගෙවා පිටපලු එකී ස්ථානයෙන් ඉවත් කළ යුතුයි.

3 ටෙන්ඩර් පත්‍ර දඹුල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරිතැනගේ කාර්යාලයේ දී ඒ සඳහා තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. නැතහොත් මුද්‍රා තබන ලද කවරයක වම්පස උඩ කෙළවරේ "පිටපලු සඳහා ටෙන්ඩර් පත්‍ර" යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

4. මේ සම්බන්ධ සම්පූර්ණ විස්තර දඹුල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කායර්‍යාලයෙන් ලබාගත හැක.

ඉඩම් සංවර්ධන නිලධාරි තැන.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මඩකලපුවේ නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් රුගම් උප කොට්ඨාශයේ මාවඩි ඔඩෙයි හි පූර්වවූ කම්කරු නිවාස තැනීම සඳහා, රුපියල් දහතුන් දාස් එක සියය (13,100) කට හෝ ඊට වැඩි ගණනකට මෙම දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවන් ගෙන්, 1960 මැයි මස 13 වැනි සිකුරාදා පූර්ව භාග 9.30 වන තෙක් ටෙන්ඩර් අයදුම් පත් භාර ගනු ලැබේ.

2. 1960 මැයි මස 12 වැනි බ්‍රහස්පතින්දා තෙක් නැගෙනහිර පලාතේ චෙන්කලාඩියේ රුගම් උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍ර පුරවා අනු පිටපතක් ද සමග එවිය යුතුයි. මඩකලපුවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කාර්යාලයේ මේ කාර්ය සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් අයදුම් පත් බහා ලිය යුතුය. අයදුම් පත් ඇතුලත් කරන ලද කවර "ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා නැගෙනහිර කොට්ඨාශය, මඩකලපුව" කියා ලිපිනය සඳහන් කළ යුතුය. 1960 මැයි මස 13 වැනි සිකුරාදා පූර්ව භාග 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. අයදුම්කරුවන් කැමැත්තේ නම් මේ ඉදිරියේ සිටිය හැක. ටෙන්ඩර් ආකෘති පත්‍ර දෙනු ලබන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 13,100 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් බව ඔප්පු කළ හැකි වාරිමාර්ග අධ්‍යක්ෂ තුමා නමට රුපියල් විසි පහක මුදලක් තැන්පත් කළ රිසිට් පතක් හෝ මුදල් මැමයක් ඉදිරිපත් කරන කොන්ත්‍රාත් කරුවන්ට පමණි.

3. රජයේ කොන්ත්‍රාත්තු දනට කරගෙන යන කොන්ත්‍රාත් කරුවන් විසින් එම කොන්ත්‍රාත්තු සතුටුදායක අන්දමින් කරගෙන යන බවට එම වැඩ භාර නිලධාරින්ගෙන් සහතික ලබාගෙන ආකෘති පත්‍ර ඉල්ලුම් කරන විට ඉදිරිපත් කළ යුතුය. නැගෙනහිර පළාතේ චෙන්කලාඩියේ රුගම් උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් වැඩි විස්තර ලබා ගත හැක.

සී. ජයසිංහ
වාරිමාර්ග ඉංජිනේරු තැන.
රුගම් උ. කො.

වාරිමාර්ග කාර්යාලය,
චෙන්කලාඩි නැ. ප.
1960 අප්‍රේල් 1 දින.

---

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

### ලංකා ටැලිෆෝන් නාමාවලියෙහි පළකිරීම් ලබාගැනීමේ අයිතිය සඳහා ටෙන්ඩර් කැඳවීම

කොමිස් ක්‍රමයට ගෙවීම කරනු ලබන ලංකා තැපැල් කන්තෝරු ටැලිෆෝන් නාමාවලියෙහි පළකිරීම් ලබාගැනීමේ තනි අයිතිය සඳහා ටෙන්ඩර් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් විසින් පළකිරීම් සඳහා ලබාගැනීමට තමන්ට ඇති පළපුරුද්ද තහවුරු කරනුවස් සාක්ෂි ද, ටැලිෆෝන් නාමාවලියෙහි එක් එක් මුද්‍රණය සඳහා හරවා ගත හැකි පළකිරීම් ප්‍රමාණයේ අඩුම වටිනාකමද, මෙම කෘත්‍යය සඳහා තමන් බලාපොරොත්තු වන අඩුම කොමිස් ප්‍රමාණයද සඳහන් කළ යුතුයි. එක් මුද්‍රණයක් සඳහා යටත් පිරිසයෙන් රු. 20,000ක් වටිනා පළකිරීම් ඔවුන් විසින් රැස් කළ යුතුයයි බලාපොරොත්තු වනු ඇත.

3. ටෙන්ඩරයන්හි මුදල් සහ කොමිස් අකුරුවලින් සහ ඉලක්කම් වලින් සඳහන් කළ යුතුයි. අකුරු සහ ඉලක්කම්වල යම්කිසි අසමානත්වයක් තිබේ නම් ටෙන්ඩරය ප්‍රතික්ෂෙප කිරීමට සිදුවනු ඇත. ටෙන්ඩරයන්හි සියළුම වෙනස් කිරීම් සහ මකා දැමීම් මත ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන තැබිය යුතුයි.

4. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු ප්‍රථම වරට 1960 ඔක්තෝබර් 1 වෙනි දින සිට අඩු තරමින් වර්ෂ තුනක්වත් මෙම කෘත්‍යය භාර ගැනීමට සූදානම් විය යුතුයි.

5. සියළුම ටෙන්ඩර් පත්‍රයන් සීල් තබන ලද කවරයන් තුළ බහා වම් කෙළවරේ "ටැලිෆෝන් නාමාවලි පළකිරීම් පිළිබඳ ටෙන්ඩර්" යන්න සඳහන් කර 1960 අප්‍රියෙල් 29 වෙනි දින පෙ. ව. 9.30ට පෙර "ටෙන්ඩර් මණ්ඩලය, විදුලි සන්දේශ අධිකාරී බාරේ, මධ්‍යම විදුලි සන්දේශ කායඝාලය, කොළඹ 1" යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

6. ටෙන්ඩර්කරුවන් තමන්ගේ සීල් තබන ලද ටෙන්ඩරයන් ලියා පදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ ඒජන්තවරුන් හෝ එම සීල් තබන ලද ටෙන්ඩරයන් 1 වෙනි කොළඹ විදුලි සන්දේශ අධිකාරි කායඝාලයයේ සහකාර අධිකාරි (සේවාවන්) තැනට බාර දී එය ලද බවට ලියවිල්ලක් ඔහුගෙන් ලබා ගත හැක. කවරයෙහි ලිපිනය සහ මතුපිට ලියනු ලබන දෑ සහ දිනය සහ වේලාව ද 5 වෙනි ඡේදයෙහි සඳහන් පරිදිය.

7. 1960 මැයි 2 වෙනි දින පෙ. ව. 10ට 1 වෙනි කොළඹ විදුලි සන්දේශ අධිකාරි කායඝාලයෙහිදී ටෙන්ඩරයන් විවෘත කරන අවස්ථා වෙහිදී පෙනී සිටීමට ටෙන්ඩර්කරුවන්ට ඉඩ දෙනු ඇත.

8. ටෙන්ඩරය භාරගත් බව හඟවන දැන්වීම ටෙන්ඩර්කරුගේ ලිපිනයට තැපැල් කිරීම හෝ එය ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයෙහි තැබීම එය ඔහු විසින් භාරගත්තා කොට සැලකිය හැක.

9. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විදුලි සන්දේශ අධිකාරි තැන විසින් ඉල්ලූ විටක ගිවිසුමකට අත්සන් කළ යුතුය. එහි විස්තර විදුලි සන්දේශ අධිකාරි කායඝාලයෙහිදී විමසිය හැක.

10. පුද්ගලිකව හෝ යම් කිසිවෙකු සමග හෝ ආණ්ඩුවට වංචාකර ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ ටෙන්ඩරයන් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

11. ටෙන්ඩරයන් එකක් හෝ සියල්ලම හෝ කිසිදු ප්‍රශ්නයක් නොමැතිව ප්‍රතික්ෂෙප කිරීමේ බලය ආණ්ඩුව සතු ය.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට් මාස්ටර් ජෙනරාල්.

කොළඹ,
60. 4. 4.

---

## නද විදුලි සැර සහ අඩු විදුලි සැර උපකරණ සැපයීම සහ භාරදීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු හා කළමනාකාර තැන වෙත ඉහතකී බඩු සැපයීමට සහ බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්‍ෂ 1960ක්වූ ජූනි මස 15 වන බදාදා පූ. භා. 12 දක්වා ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ.පෙ. 547, කොළඹ) විසින් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කායඝාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළයුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝරම වලයි. වර්ෂ 1960 ක්වූ ජූනි මස 10 වෙනි දින වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1960 ක්වූ ජූනි මස 16 වෙනි බ්‍රහස්පතින්දා පූ. භා. 10ට ප්‍රවාහණ හා වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කායඝාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ.
1960 ක්වූ අප්‍රියෙල් මස 14 වෙනි දින දීය.

---

## කලුතර දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ

වර්‍ෂ 1960 මැයි මස 9 වෙනිදා පස්වරු 2.30 දක්වා පහත සඳහන් සුළු වාරිමාර්ග වැඩ සඳහා මේ කච්චේරියේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර මා විසින් බාරගනු ලැබේ :—

**කලුතර තොටමුණ :**

(1) හල්කඳවිල, පොල්ගොඩ ඇල හරහා ප්‍රමාණකයක් (රෙගියුලේටර්) තැනීම.

**පානදුර තොටමුණ :**

(1) වෑකඩ, මෝදරවිල වෙල්යායේ ජල මාර්ගයන් යථා තත්ත්වයට පැමිණවීම.

**බටහිර පස්දුන් කෝරළය :**

(1) පන්නිල, පහළවෙල අමුණ තැනීම,
(2) බොක්කේගම ප්‍රමාණකයක් (රෙගියුලේටර්) තැනීම-පාන්තිය.

**නෑගෙනහිර පස්දුන් කෝරළය :**

(1) මොරගල, හව්දොල අමුණ ප්‍රතිසංස්කරණය කිරීම,
(2) ගිරිකොළ, යාවිට අමුණ අළුත්වැඩියා කිරීම.

**රයිගම් කෝරළය :**

(1) හාන්දුපැල්පොල, කිඳෙල්පිටිය අමුණ අළුත් වැඩියා කිරීම,
(2) හඳපාන්ගොඩ, දෙහිඅත්ත කුඹුර අමුණ තැනීම,
(3) ගුන්ගමුව අමුණ තැනීම,
(4) මාපුටුගල අමුණ අළුත් වැඩියා කිරීම.

2. එක් එක් වැඩය වෙනුවෙන් රු. 10 බැගින් මේ කච්චේරියේ තැන්පත් කිරීමෙන් මේ පිළිබඳ ආකෘති පත්‍ර 1960 මැයි මස 7 වෙනි දින පෙරවරු 11 දක්වා ලබාගැනීමට පුළුවන.

3. ටෙන්ඩර් පත්‍ර, මැයි මස 9 වැනි දින පස්වරු 3 ට විවෘත කරන අවස්ථාවේදී ඉල්ලුම්කරුවන්ට පෙනී සිටීමට ඉඩ දෙනවා ඇත. මේ පිළිබඳ වැඩි විස්තර ආකෘති පත්‍ර නිකුත් කිරීම අවසන්වන දින දක්වා මේ කච්චේරියෙන් විමසා දැනගත හැක.

කේ. බී. දිසානායක,
කලුතර දිස්ත්‍රික්කයේ අණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

කච්චේරිය, කලුතර.
1960.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

කුරුණෑගල මලියදේව ගැහැණු ළමයින්ගේ පාසැලේ හා විදුහල්පතිගේ නිවාසයේ කසල සෝධක ජල මාර්ගයක් තැනීම සඳහා 1960 පෙබරවාරි මස 26 වෙනි දින අංක 12,068 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ටැන්ඩර් දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

වී. ඊ. හේරත්,
ආ. වැ. දෙ. අ. වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ. 1960.4.7.

---

රිකිලිගස්කඩ ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවේ වෛද්‍ය නිලධාරියාට නිවාසයක් හා ගැරේජයක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960වේ මැයි මස 18 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මහනුවර ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක (නිර්මාණ) ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960වේ අප්‍රේල් මස 29 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 40,000ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කායසීලයේදීය. 60.4.7.

---

හෝමාගම යුද්ධ හමුදා කඳවුරේ විවාහක නිලධාරින්ගේ නිවාසවලට ගරාජවල් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස් වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960වේ මැයි මස 18 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. හෝමාගම ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ නිර්මාණ ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1960වේ අප්‍රේල් මස 29 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 53,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝප රේෂන්"
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කායසීලයේදීය. 60.4.7.

---

උතුරු කළුතර සුරාබදු දෙපාර්තමේන්තුවට ගුදමක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 මැයි මස 18 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කළුතර ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960වේ අප්‍රේල් මස 29 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 2,25,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන නිදසුනක් : "වෛනා නැෂිනල් මැෂිනරි ඉම්පෝට් කෝප රේෂන්"
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කායසීලයේදීය. 60.4.7.

---

කළුතර සෞඛ්‍ය හා සවසථා මධ්‍යස්ථානයක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960වේ මැයි මස 18 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කළුතර ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960වේ අප්‍රේල් මස 29 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 3,72,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්

කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝප රේෂන්"
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය. 60.4.7.

## බඩු බාහිරාදිය විකිණීම්

### වෙන්දේසියේ විකිණීම

පහත සඳහන් ද්‍රව්‍ය 1960 අප්‍රේල් මස 27 වෙනි බදාදා පෙරවරු 9 ට කොළඹ පාර්සන්ස් පාරේ රජයේ ගබඩා දෙපාර්තමේන්තුවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ:—

2 " හම්බර් හෝක් " කාරයන්—ඉතා හොඳ තත්වයේ, පීක් කැප්ස්, රෙදි පිළි,—චීත්ත, පොප්ලින්, සුදු රෙදි, අමු රෙදි, කමිස, සාරි, සරොන්, බැනියන්, යනාදිය.

මේවා බලා ගැනීමට 1960 අප්‍රේල් මස 26 වෙනි දින පෙරවරු 10 යේ සිට පස්වරු 3 දක්වා ඉඩ කඩ තිබේ.

ලබා ගන්නා සෑම ද්‍රව්‍යයකටම මුදල් ගෙවා වෙන්දේසිය නිමවන විගසම ඉවත් කළ යුතුයි.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 අප්‍රේල් මස 8 වැනි දින,
රජයේ ගබඩා දෙපාර්තමේන්තුව,
කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.